DOI: 10.31357/fhssmst.2011.00041

# මානව හිමිකම් පිළිබඳ බෞද්ධ මතය

දියගම නාරද හිමි

08 DEC 2011

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා බෞද්ධ දර්ශනය විෂය යටතේ ඉදිරිපත් කරන ස්වාධීන නිබන්ධය යි.

# මානව හිමිකම් පිළිබඳ බෞද්ධ මතය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා බෞද්ධ දර්ශනය විෂය යටතේ ඉදිරිපත් කරන ස්වාධින නිබන්ධය යි.

විෂය

**බෞද්ධ දර්ශනය**

උපදේශක : ආචාර්ය නායිම්බල ධම්මදස්සී හිමි

ලේඛ්‍යාරූඪ අංකය : GS/HU/2429/2005


දියගම නාරද හිමි

86 බී, එගොඩවත්ත පාර,

බොරලැස්ගමුව

## පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

### සහතිකය

පාලි/බෞද්ධ දර්ශනය/බෞද්ධ ශිෂ්ටාචාරය/ දර්ශනය විශේෂ උපාධි පාඨමාලාවේ අවසන් පරීක්ෂණ අවශ්‍යතාවක් සඳහා ම විසින් සම්පාදනය කරන ලද **''මානව හිමිකම් පිළිබඳ බෞද්ධ මතය''** නම් වූ ස්වාධීන අධ්‍යයන නිබන්ධය වෙනත් කිසිදු පාඨමාලාවක් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් මා විසින් හෝ වෙන අයෙකු විසින් ඉදිරිපත් කර නොමැති බවත්, මෙම ස්වාධීන අධ්‍යයන නිබන්ධය සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් ප්‍රකාශයට පත්කර නොමැති බවත් මෙම නිබන්ධය පිළියෙළ කිරීමේ දී මා විසින් පරිහරණය කරන ලද ග්‍රන්ථ, ලිපි ලේඛන හා පැවැත් වූ සාකච්ඡා ආදී මූලාශ්‍රය සියල්ල ම මෙහි දී ඇතුළත් කරන ලද බවත් මෙයින් සහතික කරමි. වාචික පරීක්ෂණයේ දී පෙන්වා දෙන ලද සංශෝධනයන් කර මෙම ශාස්ත්‍රපති උපාධි නිබන්ධය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කරමි.

ලේඛ්‍යාරූඪ අංකය : GS/HU/2429/2005

දිනය : 2011-12-07

..............................

ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ අත්සන

### අධ්‍යයනාංශ ප්‍රධාන තුමාගේ සහතිකය

අනුමත මාතෘකාව යටතේ සම්පාදනය කර ඇති ''මානව හිමිකම් පිළිබඳ බෞද්ධ මතය'' නමැති ස්වාධීන අධ්‍යයන නිබන්ධය වාචික පරීක්ෂණයේ දී පෙන්වා දෙන ලද සංශෝධනයන් කර ඇති බවත් සහතික කරමි.

දිනය : 08.12.2011

..............................

අධ්‍යයනාංශ ප්‍රධාන

# කර්තෘ ප්‍රකාශය

මෙම නිබන්ධයේ අන්තර්ගතය ආචාර්ය නායිම්බල ධම්දස්සී හිමිපාණන් වහන්සේගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කළ බවත් මෙම පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් වෙනත් විශ්වවිද්‍යාලයකට, ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි. එමෙන්ම වාචික පරීක්ෂණයේ දී පෙන්වා දෙන ලද සංශෝධනයන් කර මෙම ශාස්ත්‍රපති උපාධි නිබන්ධය පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කරමි.

.................................... 2011 - 12 - 07

අපේක්ෂකයාගේ අත්සන දිනය

# උපදේශක නිර්දේශය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත් වාචික පරීක්ෂණයේ දී පෙන්වා දෙන ලද සංශෝධනයන් කර ඇති බවත් මෙයින් සහතික කරමි.

.................................... 2011/12/08

ආචාර්ය නායිම්බල ධම්මදස්සී හිමි දිනය

(උපදේශක)

## සංක්ෂේපණ

| | | |
|---|---|---|
| අ.නි. | - | අංගුත්තර නිකාය |
| ඛු.නි. | - | ඛුද්දක නිකාය |
| චු.පා. | - | චුල්ලවග්ග පාලි |
| දී.නි. | - | දීඝ නිකාය |
| දී.නි.අ. | - | දීඝ නිකාය අටුවාව |
| ධ.ප. | - | ධම්මපදය |
| ප.පා. | - | පාරාජිකාපාලි |
| බු.ජ.මු. | - | බුද්ධ ජයන්ති මුද්‍රණ |
| ම.නි. | - | මජ්ඣිම නිකාය |
| වි.පි. | - | විනය පිටකය |
| ස.නි. | - | සංයුත්ත නිකාය |
| සු.නි. | - | සුත්ත නිපාතය |
| හේ.මු. | - | හේවාවිතාරණ මුද්‍රණ |
| B.P.S. | - | Buddhist Publication society |
| P.T.S. | - | Pali Text society |

# පටුන

| | පිටු අංකය |
|---|---|
| අධ්‍යයනාංශ ප්‍රකාශය | iii |
| කර්තෘ සහතිකය | iv |
| පිදුම | v |
| ස්තුතිය | vi |
| සංක්ෂේපණ | vii |
| පටුන | viii-ix |
| හැඳින්වීම සහ අධ්‍යයනයේ ස්වභාවය | x-xxiii |
| **පරිච්ඡේදය - 01** | |
| මානව හිමිකම් සහ එහි ඉතිහාසය | 1-20 |
| 1.1 මිනිසා යනු කවරෙක් ද? | |
| 1.2 අයිතිවාසිකම් | |
| 1.3 ඉතිහාසය | |
| 1.4 නිර්වචන | |
| 1.5 අයිතිවාසිකම් වර්ගීකරණය | |
| 1.6 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය | |
| **පරිච්ඡේදය - 02** | 21-55 |
| මානව අයිතිවාසිකම් සුරැකීමෙහි ලා බෞද්ධාකල්පය | |
| 2.1 මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය | |
| 2.2 බ්‍රාහ්මණ සමාජ සංකල්ප | |
| 2.3 කාන්තාව පිළිබඳ බ්‍රාහ්මණ ආකල්පය | |
| 2.4 බෞද්ධ මතය | |
| 2.4.1 සංවර්ධනාත්මක අංශය | |

2.4.2 සමානාත්මතා සංකල්පය

2.4.3 ජීව විද්‍යාත්මක සාධක

2.4.4 සමාජ විද්‍යාත්මක සාධක

2.4.5 ආචාර විද්‍යාත්මක සාධක

2.4.6 ආධ්‍යාත්මික සාධක

2.4.7 ඓතිහාසික සාධක

2.5 කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය

පරිච්ඡේදය - 03

බෞද්ධ ජීව හිතවාදය හා විශ්ව සමාජය පිළිබඳ ආකල්පය 56-75

3.1 සමාජය

3.2 ජීවහිතවාදය

3.3 වෘක්ෂලතාදිය කෙරෙහි දක්වෙන ආකල්පය

3.4 පරිසර සංරක්ෂණය

3.5 විශ්වසමාජය

පරිච්ඡේද - 04

නූතන මානව අයිතිවාසිකම් පිළිබඳ බෞද්ධ චින්තනය 76-111

4.1 විශ්ව ප්‍රකාශනය

4.2 අයිතිවාසිකම්

4.3 වගන්තීන්වල අරමුණු

4.4 01 වැනි වගන්තිය

4.5 2 වන වගන්තිය

4.6 3 වන වගන්තිය

4.7 10 වගන්තිය

4.8 23 වැනි වගන්තිය

සමාලෝචනය 112-116

ආශ්‍රිත ග්‍රන්ථ මාලා 117-121

උපග්‍රන්ථය

# ස්තුතිය

උපකාර කළ සැමට ......

# හැඳින්වීම සහ අධ්‍යයනයේ ස්වභාවය

## 1.1 ප්‍රවේශය

මිනිසා යනු සමාජීය සත්ත්වයෙකි. ඔහු සමාජයේ ජීවත්වන සෙසු ජීවීන්ට වඩා සුවිශේෂ ය. මේ සුවිශේෂී සත්ත්වයා සමාජයේ සෙසු සාමාජිකයින් සමග සම්බන්ධතා පැවැත්වීමේ දී භුක්ති විඳින අයිතිවාසිකම් බහුවිධ ය. නූතන ව්‍යවහාරයේ දී ඒවා මානව හිමිකම් හෙවත් මානව අයිතිවාසිකම් *(Human Rights)* නමින් හැඳින්වේ. එම අයිතිවාසිකම් සමාජයේ ජීවත්වන සියලු සාමාජිකයන්ට සාධාරණ විය යුතු යි. එ මෙන් ම තමාට හිමි අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී අනෙක් පුද්ගලයින්ගේ අයිතියට බාධා නො වන පරිද්දෙන් භුක්ති විඳිය යුතු වේ. එය උසස් සමාජයක ලක්ෂණයකි.

තවද සමාජයේ ඉදිරි ගමනට අනර්ථයක් නො වන අයුරින් ඒවා භුක්ති විඳීම ගැන ද අවධානය යොමු කිරීම වැදගත් වේ. මිනිසා තම අයිතිය උපරිම අයුරින් භුක්ති විඳීමට පැකිලෙන්නේ නැත. මුල් කාලීන මිනිසා ද කෙසේ හෝ තමාට ලැබිය යුතු දෙය ලබා ගැනීමට ක්‍රියා කළේ ය. එය මිනිස් ස්වභාවය යි. මානව අයිතිවාසිකම් පිළිබඳව අවධානය යොමු කිරීමට යෙදුණේ දුරාතීතයේ සිට ය. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම එය දැකිය හැකි ය. මුල් කාලයේ තම වර්ගයා පවා ආහාරයට ගැනීමට පුරුදුව සිටි මිනිසා පසුව ඉන් ඉවත් විය. ඉතා සීමිත අවස්ථා කීපයක හැර, මානව ශිෂ්ටාචාරයේ මුල් යුගයේ සිට මිනීමස් අනුභවය මිනිසා පිළිකුලෙන් බැහැර කළේය. මෙය මිනිසා විසින් මිනිස්කමට කරන ලද ගෞරවයකි. එ මෙන් ම ඓතිහාසික ව ගන්නා ලද එම තීරණය ද මානව අයිතිවාසිකම් ගමනේ වැදගත් සන්ධිස්ථානයකි.

යථෝක්ත ප්‍රකාශයෙන් වුව ද ආදි මිනිසා පවා තම වර්ගයාගේ අයිතිවාසිකම් ගැන අවධානය යොමුකර තිබෙන බව අවබෝධ කරගත හැකි ය. වත්මන් මිනිසා යනු ක්‍රම ක්‍රමයෙන් දියුණුවට පත් වූ සමාජ පරිණාමයේ ප්‍රතිඵලයකි. එහෙයින් ඔහු මුල්කාලීන මිනිසාට වඩා අයිතිවාසිකම් සමූහයක් භුක්ති විඳියි. එ සේ ම තමාට නො ලැබී යන යම් දෙයක් වේ නම් එය ලබා ගැනීමට නොයෙක් ක්‍රියා මාර්ග අනුගමනය කරයි. කෙසේ හෝ ඔහු ඒ සඳහා

සංවිධානය වී තම හිමිකම් අහිමි කරනු ලබන පුද්ගලයන්ට හා සංවිධානවලට විරුද්ධව කටයුතු කිරීමට හැකි තත්ත්වයක් උදා කරගෙන ඇත.

වර්තමාන මානව අයිතිවාසිකම් පිළිබඳව අධ්‍යයනය කරන විට පෙනී යන කරුණක් නම් බොහෝ විට මානව හිමිකම් පිළිබඳ නීතිමය ස්වරූපයකින් කරළියට පිවිසීම යි. වර්තමානයේ තම අයිතිය තහවුරු කර ගැනීම සඳහා අන් අයට එරෙහිව මානව අයිති ගැන මතවාද ඉදිරිපත් කිරීම දක්නට ලැබේ.එහෙත් එය අන් අයගෙන් යමක් ලබා ගැනීමට භාවිත කරන සටන් පාඨ බවට පත් වී ඇත. ඒ අනුව මානව හිමිකම් අනුන් කෙරේ අභියෝගාත්මක වෙමින් ලබාගත යුත්තක් සේ පෙනෙයි. මානව හිමිකම් පිළිබඳ මෑත ඉතිහාසය දෙස බලන විට ද මෙම තත්ත්වය අපට අවබෝධ කරගත හැකි ය. සෑම තැන දී ම තමාට තම කොටස නො ලැබී යාම හේතුවෙන් එය හොඳින් නැත්නම් නරකින් හෝ ලබා ගැනීමට ගන්නා ලද නොයෙකුත් උත්සාහවල ප්‍රතිඵලයක් ලෙස මානව හිමිකම් යැයි නම් කරගත්, සම්මත කරගත්, කොන්දේසි මාලාවක් වත්මන් ලෝකයා අත තිබේ. එහි සඳහන් වන ආකාරයට මිනිසාට බොහෝ දේ නො ලැබී ගොස් ඇති බව පෙනෙයි. නො ලැබී යන අයිතිවාසිකම් නීත්‍යානුකූලව ලබා ගැනීමට මෙම මානව හිමිකම් සම්මුති උපකාරී වේ. දෙවන ලෝක යුද සමයේ දී මිනිසාට මිනිසෙකු ලෙස ජීවත් වීමට අවස්ථාවක් නො ලැබුණි. ඔහුට මිනිසෙකු ලෙස හිමි විය යුතු අවම අයිතිය පවා අහිමි කරන ලදී. විශාල පිරිසක් මින් පීඩාවට පත් වූහ. හිට්ලර් වැනි අධිරාජ්‍යවාදීන්ගේ අත්තනෝමතික බලලෝභී ක්‍රියා කලාප නිසා මුළු ලොව ම එක ම මළ ගෙයක් බවට පත් විය. ඒ අනුව මිනිසාගේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා නීත්‍යානුකූල පිළිවෙත් සකස් කිරීමට ලෝක ප්‍රජාව උත්සුක වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1948 දෙසැම්බර් 10 වැනි දින මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය රටවල් එකසිය ගණනක සහභාගිත්වයෙන් සම්මත කෙරුණි.[1] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය නිසා මානව හිමිකම් සුරැකීම සම්බන්ධයෙන් ලෝක ප්‍රජාවට යම් විශ්වාසයක් ඇති විය. එහෙත් මානව අයිති පිළිබඳ වත්මන් සමාජ සංවිධාන කතා කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳ කරුණු පැහැදිලි කළේත්, මානව අයිතීන් සුරක්ෂිත කරන ලද්දේත්, බුදුරජාණන් වහන්සේ ය. මේ උත්තරීතර යෝජනාවට පසුබිම් වී ඇති ප්‍රජාතාන්ත්‍රික *(Democratic)* සමාජවාදී *(Socialist)* සමානාත්මතා *(Equality)* සංකල්පයේ ප්‍රභවය

කොතනින් ඇති වූවක් දැයි සොයා බලන්නෙකුට එම ගවේෂණයේ නිමාව දැකගත හැකි වන්නේ බුදුරජාණන් වහන්සේ ගෙනි.[2]

එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය මගින් තහවුරු කිරීමට තැත් කරන ලද මානව හිමිකම් පිළිබඳ වඩාත් විස්තරාත්මකව කරන ලද පැහැදිලි කිරීම් බුදු දහමේ ඇතුළත් ය. බුදු දහම පැහැදිලි කරන ආකාරයට මානව හිමිකම් අභියෝගයෙන්, නඩු මාර්ගයෙන් බලහත්කාරයෙන් ලබාගත යුත්තක් නො වේ. බුදුදහම සාමකාමී වූත්, අන්‍යෝන්‍යාවබෝධය හා අන්‍යෝන්‍ය ගෞරවය පිළිගන්නා වූත්, සමාජ දර්ශනයක් ඉදිරිපත් කරන හෙයින් මානව අයිතිවාසිකම් ද ඔවුනොවුන් විසින් අවබෝධයෙන් ලබා ගත යුත්තක් සේ සලකයි. වරක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම කෙසේ සකස් විය යුතු දැයි පර්යේෂණයක යෙදීමට ශ්‍රීමත් මාකිස් ඔෆ් සෙට්ලන්ට් සාමි වරයාට පැවරිණි. එහි දී ඔහු සියලු ආගමික දාර්ශනික ග්‍රන්ථ ඇසුරෙන් තම පර්යේෂණය සිදු කොට මෙබඳු ප්‍රකාශයක් කළේ ය. **"බුදුරජාණන් වහන්සේ තරම් මිනිස් අයිතිවාසිකම් සුරැකීමෙහි ලා සර්ව සාධාරණ වූත්, යුක්ති සහගත වූත් එඩිතර වූත්, ප්‍රජාතාන්ත්‍රික පියවර වෙනත් කිසිදු ආගමික ශාස්තෘවරයෙක් තම ආගමික ඉගැන්වීම්වල අවධාරණය කොට නැත."**[3] මෙමගින් අන්‍යාගමික මධ්‍යස්ථ මතධාරී වත්මන් උගතුන් බුදුරජාණන් වහන්සේ ගේ මානව දයාව අගය කළ අයුරු පැහැදිලි වේ.

මානව හිමිකම් සුරැකීම සම්බන්ධයෙන් නූතනයේ බිහි වී ඇති සංකල්ප වර්තමාන උගතුන්ගේ සොයාගැනීමක් නො ව, මීට සියවස් ගණනකට පෙර බුදුරජාණන් වහන්සේ වදාළ, එ සේ ම සාර්ථක ව ක්‍රියාත්මක කරන ලද උතුම් බුද්ධ දේශනා බව මොනවට පැහැදිලි වේ. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ ක්‍රි. පූ. 6 වන සියවසේ දී ය. ඒ වන විට මිනිසකු විසින් ලැබිය යුතු අවම වූ අයිතිවාසිකම් පවා අහිමි වූ පිරිසක් භාරත සමාජයේ වාසය කළේ ය.[4]

එම සමාජයේ ද දැඩි සේ පීඩාවට පත්වූයේ කම්කරු පන්තිය යි. දෙවන ලෝක යුද සමයේත්, ඉන් පෙරත්, පසුත් පීඩනයට ලක්වූයේ ද කම්කරුවන් ම ය.[5] කාර්මික විප්ලවයේ දී වැඩි මෙහෙවරක් ඉටු කළ ද කම්කරුවන්ට ලැබුණ සාධනීය ප්‍රතිඵලයක් නොවී ය. එහි නියම ප්‍රතිඵල භුක්ති වින්දේ ප්‍රභූ පන්තිය යි. ඔවුන් තම පැවැත්ම උදෙසා කම්කරු පන්තියේ නැගී සිටීම මැඩ පැවැත්වී ය. කම්කරුවන් යම් හෙයකින් නැගිට සිටියහොත් තම පැවැත්ම ප්‍රබල අභියෝගයකට ලක්වන බව දත් ප්‍රභූහු කම්කරු පන්තියේ කොඳු නාරටිය බිඳ දැමීමට සෑම

විටම උත්සාහ ගත්හ. මෙබඳු සමාජ තත්ත්වයක් ක්‍රි. පූ. 6 වන සියවසේ භාරතයේ ද පැවතුනි. එහි සියලු අණසක ක්‍රියාත්මක කරවන ලද්දේ බ්‍රාහ්මණ පන්තිය විසිනි. තමාගේ පැවැත් ම උදෙසා අහිංසක මිනිසුන් පිරිසක් පාගා ගෙන සිටීමට තරම් එකල සමාජීය ප්‍රභූ පන්තිය සාහසික විය. එහෙයින් ඔවුන් කෙරෙහි වෛරයක්, ඊර්ෂ්‍යාවක් ඔවුන්ගේ සිත් තුළ ඇති විය. එහෙත් තමාට සිදුවන සමාජ අසාධාරණය වෙනුවෙන් නැගී සිටීමට, අරගල කිරීමට තරම් හැකියාවක් ඔවුන්ට නොතිබූ හෙයින් ප්‍රභූ පන්තියේ තාඩන පීඩන ඉවසාගෙන සිටීමට ඔවුහු පුරුදු වී සිටියහ. විශේෂයෙන් වෛදික යුගයේ සිට පැවත ආ අදහස් වර්ධනය වී බ්‍රාහ්මණ මූලික සමාජයක් බිහි වීමත් සමග මෙම සමාජ අසාධාරණය උත්සන්න විය. බමුණන් කියා සිටියේ තමන් ''මෙලොව වසන දෙවියන්'' හෙවත් ''භූසුර'' බව ය.

බ්‍රාහ්මණ වර්ණය ම ශ්‍රේෂ්ඨ ය. අන්‍ය වර්ණයෝ පහත් ය. බ්‍රාහ්මණ වර්ණය ම සුදු වර්ණ ය. ඉතිරි වර්ණ තුන කාල වර්ණ ය. බ්‍රාහ්මණයෝ ශුද්ධ වෙති. අබ්‍රාහ්මණයෝ ශුද්ධ නොවෙති. බ්‍රාහ්මණයෝ ම බඹුගේ මුවින් බිහි වූ බඹුහුගෙන් උපන්, ඔහුගේ ඖරස පුත්‍රයෝ ය. (**බ්‍රාහ්මණෝ'ව සෙට්ඨො වණ්ණො, හීනා අඤ්ඤෙ වණ්ණා, බ්‍රාහ්මණෝ'ව සුක්කෝ වණ්ණෝ, කණ්හා අඤ්ඤෙ වණ්ණා, බ්‍රාහ්මණෝ'ව සුජ්ඣන්ති. නො අබ්‍රාහ්මණා බ්‍රාහ්මණා'ව බ්‍රාහ්මණෝ පුත්තෝ ඔරසා මුඛතෝ ජාතා බ්‍රහ්මජා බ්‍රහ්ම නිම්මිතා බ්‍රහ්මදායාදා**"). [6]

මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි මුල් ම වගන්තිය වන්නේ **''සියලු මනුෂ්‍යයෝ නිදහස් ව උපත ලබා ඇත. ඔවුහු ගරුත්වයෙන් සහ අයිතිවාසිකම්වලින් සමාන වෙති. යුක්ති අයුක්ති පිළිබඳ හැඟීමෙන් හා හෘදය සාක්කියෙන් යුත් ඔවුන්, ඔවුනොවුන්ට සැලකිය යුත්තේ සහෝදරත්ව පිළිබඳ හැඟීමෙනි''** යන්න යි. මිනිසාට මිනිසෙකු ලෙස සැලකීමට, ඔහුගේ නිදහස සීමා අගය කරමින් කටයුතු කිරීමට බල කිරීමට සිදුවීම කණගාටුදායක දෙයකි. ක්‍රි.පූ.06 වන සියවස යනු මිනිස්කමට තරම් නොවන සේ අයිතිවාසිකම් උල්ලංඝනය වූ කාල පරිච්ඡේදයකි. එකල බ්‍රාහ්මණ සමාජය තුළ පුද්ගල නිදහස, ස්වාධීනත්වය, හෑල්ලුවට ලක් කළ ක්‍රියා කලාපයන් බොහෝ විය. ඊශ්වර නිර්මාණවාදය, නියතිවාදය, අධිච්චසමුප්පන්නවාදය, ශාස්වතවාදය, උච්ඡේදවාදය වැනි මත වාදයන් මගින් සිදුවූයේ එම කාර්යම යි.[8] මිනිසා බෙහෙවින් අගය කළ ස්වාධීනත්වය, නිදහස අහිමි කළ මේ ඉගැන්වීම් ඔහු රූකඩයක් බවට පත් කළේ ය. මහා බ්‍රහ්මයාගේ මැවීම පදනම්

කරගෙන සමාජය කොටස් හතරකට බෙදූ බමුණෝ එහි ප්‍රමුඛත්වය ලබා ගත්හ. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යැයි බෙදුණ සමාජ පන්ති හතරෙන් දැඩි සේ පීඩාවට පත්වූයේ ශුද්‍ර පංතිය යි.[9] එකල සමාජය තුළ පැවති මෙම පන්ති පරතරය නිසා විශාල පිරිසකගේ මානව හිමිකම් උල්ලංඝනය වූ අයුරු බුදුරජාණන් වහන්සේ මැනවින් දුටු සේක. ඒ පිළිබඳ කරුණු දේශනා කළ උන් වහන්සේ මානව අයිතී සුරක්ෂිත කිරීමට ප්‍රායෝගික ව දායක වූහ. යම් සමාජයක මානව හිමිකම් මැනවින් ආරක්ෂා නො වන්නේ ද එහි විශාල ලෙස සමාජ ප්‍රශ්න උද්ගත වනු ඇත. තම අයිතිවාසිකම් ගැන නොදන්නේ නම්, ඒවා කඩවීම් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය නො දන්නේ නම්, සාමාන්‍ය ජනතාව නිහඬ පිළිවෙතක් අනුගමනය කරයි. එ බැවින් මුලින් ම කළ යුත්තේ මානව අයිතිවාසිකම් පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම යි. එවැනි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සිදුවීමට පදනම කුමක් දැ යි සොයා එයට විරුද්ධ ව ප්‍රබල ජනමතයක් ගොඩ නැගීම ද වැදගත් වේ. අකාරුණික, කෲර නො මිනිස් හැඟීම් මිනිස් සිත් තුළින් හැමදාම ඉවත් කිරීමට අවශ්‍ය ස්ථිරසාර පියවරක් ගැනීම ද ඉතා අගනේ ය. මිනිසා මිනිසකුගේ ම වහලෙකු නො විය යුතුවාක් මෙන් ම අදෘශ්‍යමාන දෙවියෙකුගේ හෝ බලවේගයක වහලෙකු ද නො විය යුතු බව බුදුරජාණන් වහන්සේ පුන පුනා අවධාරණය කළහ. ඒ අනුව භාරතීය සමාජයේ පැවති මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි දේශනයක් කරන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. විශේෂයෙන් පන්ති භේදයට අනුව පුද්ගලයා වර්ග කිරීම යුක්තියුක්ත නො වන බව දේශනා කළහ.

**න ජච්චා වසලෝ හෝති - න ජච්චා හෝති බ්‍රාහ්මණො**

**කම්මනා වසලෝ හොති - කම්මනා හෝති බ්‍රාහ්මණො**[10]

කෙනෙකු උත්පත්තිය අනුව ප්‍රභූවරයෙකු හෝ පීඩිතයෙකු වන්නේ නැත. ඔහු යම් පන්තියකට ඇතුළත් වනුයේ ඔහු කරනු ලබන ක්‍රියාකාරකම් අනුව ය. බුදුරජාණන් වහන්සේගේ මෙම ප්‍රකාශය එදාට වඩා වත්මන් සමාජයට බෙහෙවින් යෝග්‍ය වේ. වැඩවසම් රදළ ආකල්ප දරන්නන්ගේ මතය වන්නේ උත්පත්තියෙන් ම අන් අය තම යටත් සේවකයන් වී ඇති බව යි. එයින් සිදුවූයේ පීඩිත පංතියේ අයිතිවාසිකම් දිනෙන් දින උල්ලංඝනය වීම යි. එයට පිළිතුරු සැපයීමක් වශයෙන් ලෝක ප්‍රජාව එක් ව සැමගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා විශ්වප්‍රකාශයක් සම්මත කරගත්හ. එය සිදු වූයේ වර්ෂ 1948 දී ය. ඊට අවුරුදු දහස්

ගණනකට පෙර එනම් ක්‍රි.පූ. 06 වන සියවසේ දී බුදු රජාණන් වහන්සේ මේ තත්ත්වයට පැහැදිලි සංකල්පයක් ඉදිරිපත් කළහ. මිනිසකු වශයෙන් සැමට එක සේ ජීවත්වීමේ අයිතිය ලැබෙන්නේ නම් දක්ෂ පුද්ගලයෝ දිළිඳු බවින් මිදී දියුණුව කරා ගමන් කරති. එසේ ඕනෑ ම කෙනෙකුට දියුණු විය හැකි බව බුදුරජාණන් වහන්සේ පැහැදිලි කළහ. අනෙකුත් දේවවාදී ආගම් මිනිසාගේ පුද්ගල පෞරුෂය *(Personality)*, ස්වාධීනත්වය *(Independence)* නො පෙනෙන දෙවියෙකුට පාවා දුන්න ද බුදුරජාණන් වහන්සේ මිනිසාගේ නිදහස උදාකර දුන්හ. යමෙකුට දාසයෙකු වීමටත්, දාසයකු වී ආර්යයකු වීමටත් හැකියාව ඇතැයි බුදු දහම පැහැදිලි කරයි.[11] මෙය මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමකි. ("**අයෙ‍ය්‍යා හුත්වා දාසෝ හෝති දාසෝ හුත්වා අයෙ‍ය්‍යා හෝති**")

මෙලෙස බුද්ධකාලීන භාරතීය සමාජය තුළ සිදු වූ මානව හිමිකම් උල්ලංඝනය බුදුරජාණන් වහන්සේ තරයේ විවේචනය කළහ. බ්‍රාහ්මණ වර්ණභේදය, ශුද්ධ ආත්මය, ගැළවුම්කරු, පුද පූජා, යාගහෝම, ඇදහීම්, විශ්වාස, යාඥා කිරීම් ආදී ක්‍රියා මගින් මිනිසා ආගම් වහලෙකු බවට පත් කිරීම නිසා ඔහුගේ නිදහස, හෘදය සාක්ෂිය පිළිබඳ අයිතිය දැඩි සේ උල්ලංඝනය කර ඇති බව පෙන්වා දුන්හ. එහෙත් බුදුරජාණන් වහන්සේ

"ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන මහා නදී වේ ද, යම් සේ ඒවා මුහුදට පැමිණ පළමු නම්ගොත් හරී ද, මහ මුහුද යැයි ම ව්‍යවහාර වේ ද, එසේ ම මහණෙනි, ක්‍ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර යන මේ සතර කුල වේ ද, ඒ කුල වලට අයත් යමෙක් ගිහි ගෙයින් නික්ම තථාගත ශාසනයෙහි පැවිදිව පළමු නම් ගොත් හරී ද, ශාක්‍ය පුත්‍රීය ශ්‍රමණ යැයි ව්‍යවහාරයට යයි"[12] (**ගංගා යමුනා අචිරවතී සරභූ මහී තා මහා සමුද්දං පබා ජහන්ති පුරිමානිනාම ගොත්තානි, මහ සමුද්දෝත්වේව සංඛං ගච්ඡන්ති ඒව මේව බො භික්ඛවෙ චත්තාරෝ මෙ වණ්ණා ඛත්තියා, බ්‍රාහ්මණ වෙස්සා, සුද්දා, තෙ තථාගප්පවේදිතෙ ධම්ම විනයෙ අගාරස්ස අනගාරියං පබ්බජිත්වා ජහන්ති පුරිමානි නාමගොත්තානි සමණ සක්‍ය පුත්තියාත්වේව සංඛං ගච්ඡන්ති**").මේ ආකාරයට මානව අයිතිය තහවුරු කළහ.

බමුණන් තම තත්ත්වය ආරක්ෂා කර ගැනීම් වස් කරන ලද සමාජ පීඩාකාරී තත්ත්වයන්ට බුදුරජාණන් වහන්සේ ප්‍රායෝගික ව පිළිතුරු සැපයූ අයුරු උක්ත දේශනයෙන් පැහැදිලි වේ. පීඩිත පන්තිය තුළ ද උදාර පුද්ගලයන් සිටින බව බුදුරජාණන් වහන්සේ ඔප්පු කළහ. සුනීත,[13] සෝපාක[14] වැනි පහත් කුලවල දරුවන් පැවිදි වී දෙව්-බඹුන් වඳින පුදන

තත්ත්වයට පත් විය. සාමාන්‍ය ජන සමාජය තුළ අයිතිවාසිකම් අහිමි ව සිටි පිරිසට බුදු සසුන තුළ පැහැදිලි නිදහසක්, ගරු කිරීමක් ඇති විය. සියලු සතුන්ගේ අයිතිවාසිකම් සුරැකීම සම්බන්ධයෙන් (සබ්බේ සත්තා) අවධානය යොමුකළ බුද්දහම මානව අයිතිවාසිකම් මොනවට තහවුරු කර ඇත.

කිසි ම පුද්ගලයකු උපතින් බ්‍රාහ්මණයෙකු හෝ වසලයකු නො වන බව බෞද්ධ ආකල්පය යි. එ මෙන් ම මිනිසා ගේ උසස් පහත් බව මැන ගන්නට ඉඩ හැර තිබීම ද, සමාජ ගතිකත්වය තුළ උසස් වීම සඳහා මානවයන්ට මූලික අයිතිවාසිකමක් තහවුරු කිරීමකි. තම කුසලතා උපයෝගී කර ගනිමින් දියුණුවීම සඳහා අධ්‍යාපනය, ආර්ථික ක්‍රියාමාර්ග හෝ දේශපාලන චර්යා උපයෝගී කර ගැනීමට බුද්දහම එරෙහි නො වේ. මහ මගින් අහුලාගත් මියගිය මීයකුගේ මළ සිරුර විකුණා සිටුවරයෙකු බවට පත් දුගියකු පිළිබඳ පුවත චුල්ලසෙට්ඨි ජාතකයේ කියවෙයි. විශේෂයෙන් පැවිදි වූ පසු ව සියලු කුල, වර්ණ, ගෝත්‍ර භේදාදිය හැර එක ම ආර්ය ශ්‍රාවක පිරිස තුළ සුසංගත වීමට ඕනෑ ම පුද්ගලයෙකුට ඉඩ සලසා තිබීම මානව අයිතිය ගරු කිරීම පිළිබඳ ඉතාමත් ව්‍යක්ත නිදර්ශනයකි. බුදුරජාණන් වහන්සේ ගේ දහම කිසිම ප්‍රාදේශීය ව්‍යවහාරයක හෝ භාෂාවක හිර කර නො තබා විවිධ ප්‍රදේශවල විවිධ ප්‍රජාවනට තම තම භාෂා ව්‍යවහාර මගින් ඉගෙනුමට ඉඩ සලසා ඇත්තේ ද මානව අයිතිය සුරකිමිනි.[15] අවසාන වශයෙන් බෞද්ධයාගේ අවසන් අරමුණ (නිවන) වෙත ළඟා වීමේ පරම අයිතිය ද මිනිසාට ම පවරා තිබේ.

## 1.2 අධ්‍යයනයේ ප්‍රායෝගික වැදගත්කම

මෙම අධ්‍යයනය සඳහා තෝරාගත් විෂය පථය නූතන සමාජය තුළ බෙහෙවින් අවධානයට යොමු වූවෙකි. වර්තමානය තුළ මානව අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කිරීම ඉක්මවා යමින්, සත්ත්ව, පරිසර, සමාජ, ආර්ථික, දේශපාලන යනාදී වශයෙන් දියුණු ව පවතී. එම අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමෙහි ලා රාජ්‍ය සංවිධාන *(Government organisations)* මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන *(Non-Government organisations)* ද බිහිව ඇති බව දැකගත හැකි ය. ඒ සඳහා සම්මත කරන ලද පනත්, ව්‍යවස්ථා, ගිවිසුම් යනාදිය ද බහුවිධ ය. එහෙත් නූතන සමාජය තුළ බහුල වශයෙන් මිනිස්සු හා සත්ත්වයෝ ස්වභාවික පරිසරය තුළ විවිධ අවස්ථාවල තමන්ට හිමි මූලික අයිතී පවා අහිමි වී සමාජ අසාධාරණයට, අසහනයට පත් වෙති. මිනිසා ගේ අයිතීන් වෙනුවෙන් යැයි පෙනී සිටින සංවිධාන බොහෝ සෙයින්